# ආගමික මැරයෝ තලාහේන දේවස්ථානයට පහර දෙති

ලංකාව යම් දවසක සිංහල=දෙමළ වශයෙන් පමණක් නොව,

සිංහල=මුස්ලිම් සහ අවසන් වශයෙන් බෞද්ධ=අබෞද්ධ වශයෙනුත් බෙදෙන සහ ඒ බෙදීම් උඩ එකිනෙකා මරා ගන්නා තිරශ්චීන දේශයක් බවට පත්වීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකැ යි මෙ කොළමෙ බොහෝ විට ලියැවී ඇත. ආගම එහි මූලික සාරයෙන් පීලි පැන ඇති අද වන විට, තත්ත්වය තවත් බරපතල ය.

සියළු බෙදීම් ඉක්මවන පොදු මිනිස් නිෂ්ටාවක් ස්ථාපිත කර ගැනීම සඳහා සුක්ෂම කළමනාකරණයක් අවශ්‍ය වන්නේ මේ අදියරේ දී ය. අංකගණිතමය බහුතරය හෝ ඉතිහාසයේ දීර්ඝත්වය හෝ ආගමක පාරිශුද්ධ භාවය හෝ නිසා කිසි කණ්ඩායමකට තවත් කණ්ඩායමක් කෙරෙහි ආධිපත්‍යය පැතිරවීමට අයිතියක් නැත්තේ ය. මේ පාඩම උගැනීම පමා කරන තරමට, ඇති විය හැකි අතුරු ආන්තරා අපමණ ය. ජාතිය වශයෙන් බෙදෙන බෙදීම, ඊ ළඟට ආගම වශයෙන් බෙදීමට වැඩි කලක් නො යයි. දෙමළාට එරෙහිව එක වේදිකාවට නගින සිංහලයා, ඊ ළඟට සිංහල=බෞද්ධයා සහ සිංහල=කිතුණුවා වශයෙන් භින්න වෙයි.

පසු ගිය ජූලි 6 වෙනි දා උදේ 9.00 පූජාවට මාලබෙ, තලාහේන කල්වාරි දේවස්ථානයට බැතිමත්තු රැස් වූ හ. ඒ, ස්වකීය ආගමික වතාවත් වෙනුවෙනි. භික්ෂූන් වහන්සේලා සිව් නමක් පෙරටුව මහා ගිහි පිරිසක් මේ අවස්ථාවේ එම දේවස්ථානයට කඩාවැදුණි. යාච්ඥාවට සහභාගී වෙමින් සිටි පූජකවරයාට සහ තවත් කිහිප දෙනෙකුට තිරිසන් ලෙස පහර දුනි. අවසානයේ දින පහක් රෝහල්ගත ව ප්‍රතිකාර ලැබීමට පූජකවරයාට සිදු විය.

වරද, අන්‍යාගම්වලට හැරවීම නැමැති ඊනියා අපරාධයයි .

විපතට පත් බැතිමතුන් ගේ දුරකථන ඇමතුම්වල ප්‍රතිඵලයක් වශයෙන් එහි පැමිණි පොලිස් නිලධාරීන් ඉදිරියේ පවා මේ මැර පිරිස් දමනය කර ගැනීම අපහසු විය. එකී ප්‍රහාරයට සහභාගී වූ එක් බෞද්ධ භික්ෂුවකට අනුව, ඔවුන්ගේ අරමුණ වුණේ, පල්ලිය ගිනි තැබීම හෝ මුළුමණින් බිමට සමතලා කිරීම ය. අරුමය වන්නේ, මේ සා විපතක් සිදු ව තිබියදීත්, පසු ගිය ඉරිදා

(13) ‘සන්ඩේ ලීඩර් පුවත්පත විසින් මෙ පවත නිරාවරණය කරන තෙක් කිසි මාධ්‍යයක් (රාවය ද ඇතුළු ව) ඒ බිහිසුණු ක්‍රියාව සාමාන්‍ය ප්‍රවෘත්තියක් වශයෙන් වත් රටට දැනුම් දී නො තිබීම යි.

මෙ පිරිස, තමන් එ සේ අන්‍යාගම්වලට හැරවීමෙ ව්‍යාපාරයක නිරත නො වුණු බව කියති. එහෙත් ඇත්ත වශයෙන් ම ඔවුන් එ සේ තමන් ගේ ආගමට හරහා ගැනීමෙ ව්‍යායාමයක නිරත ව සිටියත්, ඔවුන්ට පහර දීමට සහ තමන් ගේ ආගම ප්‍රචාරය කිරීමට ඔවුන්ට ඇති ප්‍රජාතන්ත්‍රීය අයිතිය උදුරා ගැනීමට තවත් කෙනෙකුට ඇති අයිතිය කුමක් ද? විශේෂයෙන් ම, බුදුරාජාණන් වහන්සේ ගේ මෛත්‍රී සසුනේ සිවුරු දරා සිටින භික්ෂුවකට මෙ වැනි හිංසනයක පෙරමුණ ගැනීමට ඇති අයිතිය කුමක් ද?

බුද්ධත්වයට පත් සැණින් බුදුන් වහන්සේ ගේ අභිමතය වුණේ අන්‍යාගම්වලට හැරවීමෙ තිඹිරිගෙය ම ප්‍රතික්ෂේප කිරීමයි. එ නම්, තමන් වහන්සේ අවබෝධ කර ගත් ධර්මය දේශනා නො කර සිටීම යි. එහෙත් සක්‍ර දේවේන්ද්‍රයා ගේ බලවත් පෙරැත්තය මත ඒ අදහස අත්හළ උන්වහන්සේ පස්වග මහණුන්ට ධර්ම දේශනා කිරීමට ඉටා ගත් හ. අන්‍යාගම්වලට හැරවීමෙ ආරම්භය බුදුන් වහන්සේ ගෙන් ම ඇරැඹෙන්නේ එ ලෙසිනි.

ඉන් පසු ලංකාව බෞද්ධ රටක් වන්නේ කෙ සේ ද? මිහිඳු මහ රහතන් වහන්සේ මිහින්තලයට වැඩම කොට දේවානම්පියතිස්ස රජතුමාට ධර්මය දේශනා කිරීමෙනි. මිහිඳු හිමියන් යනු අශෝක අධිරාජයා ගේ පුතනුවන් ය. සිය පුතනුවන් ලංකාවට පිටත් කර එවීමෙ දී ඉන්දියානු අධිරාජයා ගේ අසහාය බල පරාක්‍රමය වක්‍ර ආකාරයෙන් හෝ දේවානම්පියතිස්ස රජු කෙරෙහි බලපාන්නට නැතැ යි එකහෙලා කිව හැකි ද?

කෙ සේ වෙතත්, බලය යෙදවීම දෙ වන කාරණයකි. හේතුව, ආගම සම්බන්ධයෙන් නො ව වෙනත් ඕනෑ ම කාරණයක් සම්බන්ධයෙන් වුව බලහත්කාරය වරදක් බවට අප කා අතරත් විවාදයක් නැති බැවිනි. මෙ කාරණය දෙස විමසිල්ලෙන් බැලූ විට පෙනෙන්ට ඇත්තේ, අන්‍යාගම්වලට හැරවීම ලංකාවෙ සමාජ ගැටුමකට තුඩු දී ඇත්තේ ඔය කියන බලහත්කාරයක් නිසා නො ව, හුදෙක් ආගම මාරු කිරීම ම, එහි දී ද, බුද්ධාගමෙන් වෙනත් ආගමකට මාරු වීම, ඉවසා වැදැරිය නො හැකි පාපයක් වශයෙන් සැළකීම නිසා ය. ලංකාවේ දී මෙය බෞද්ධ රෝගයකි. ඇෆ්ගනිස්ථානයේ දී මුස්ලිම් රෝගයකි. 17 වන සියවස වන තෙක් යුරෝපයේ දී කතෝලික රෝගයකි.

මා දන්නා පරිදි, තමන්ගේ ආගමට වෙනත් ආගමිකයන් හරවා ගැනීමට මොන ම වෙහෙසක් වත් අද නො ගන්නා එක ම ප්‍රධාන ආගම යුදෙව් ලබ්ධිය යි. මෙ ආගමිකයන් මීට සහස්‍ර දෙකකට මත්තෙන් ක්‍රිස්තුස් වහන්සේ ව ඇණගැසුවේ අන්‍යාගමක් දේශනා කිරීම නිසා ය. එහෙත් පසු කලෙක යුදෙව් ආගම රාජ්‍යත්වයෙන් බැහැර වීමෙ සිට ක්‍රම ක්‍රමයෙන් එය පුද්ගල විමුක්තිය කෙරෙහි පමණක් සීමා විය. අද වන විට, වෙනත් ආගමිකයෙකුට යුදෙව් ආගමට බැඳීම අතිශය අසීරු කර්තව්‍යයක් වී ඇත්තේ ඒ නිසා ය.

අනිත් සෑම ප්‍රධාන ආගමක් ම එහි අනිත් පැත්ත ය. ඒ නම්, තමන් අදහන විමුක්තිය අනුන් ද ඇදහිය යුතු බවට තරයේ විශ්වාස කරන්නන් සහ එය ඒ සේ වන බවට වගබලා ගැනීම මරාගෙන මැරෙන වගකීමක් වශයෙන් දකින්නන් ය. ආගම යනු පුද්ගල විමුක්තිය පිළිබඳ කාරණයක් නම්, අනිකා ගේ විමුක්තිය ගැන මට ඇති රුදාව මට නො වැටහේ. සෞඛ්‍ය කාරණයක්, දේශපාලනික කාරණයක්, මගේ සෞඛ්‍යයට සහ මගේ දේශපාලනයට ඍජු ව හෝ වක්‍ර ව බලපාන බැවින්, එහි දී අනුන් පිළිබඳ මගේ බලපෑමක අදාළත්වය මට තේරුම් ගත හැක. ඇතැම් විට ප්‍රචණ්ඩත්වයෙන් (විප්ලවයෙන්) පවා අනිකා ගේ සුභ සිද්ධිය (සමාජවාදය) වෙනුවෙන් කෙනෙකු පෙනී සිටීම (ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත්තත්, නැතත්) ඒ අනුව අපට වැටහේ. හේතුව, ඉෂ්ට සිද්ධ කර ගැනීමෙ ඉලක්කය පොදු අවශ්‍යතාවයක් වන බැවිනි. එහෙත් මම නිවනට යන විට, නැත් නම් මම ස්වර්ගයට යන විට අල්ලපු ගෙදර එකා ද මා සමග එහි යා යුතු යැයි මා සිතන්නේ ඇයි? සිවිල් ජීවිතයේ දී හැකි තාක් අනිකාට කුඩුකේඩු කම් කරන මම, ආගමේ දී පමණක් ඔහු මගේ සගයෙකු විය යුතු යැයි සිතමි. අන්‍යාගමිකයෙකුට හිමි කර ගත නො හැක්කෙකු විය යුතු යැයි හඟිමි.

අද වන විට, ආගම යනු කිහිලිකරුවකැ යි මා කියන්නේ ඒ බැවිනි. මගේ දෙපයින් සිට ගැනීමට ශක්තියක් නැති, ආත්මීය බෙලහීනතාවකින් පෙළෙන මම, අනිකා මා සමග එකට සිටගෙන සිටීම මගේ දෙපයට වාරුවකැ යි හඟීමි. ඔහු මා හැරපියා වෙනත් උන් සමග පෙළ ගැසෙන විට මගේ අප්‍රාණික දෙපා තවත් හිරිවැටෙයි.

අප ශීලාචාර මිනිසුන් වන්නේ කවදා ද?

Gamini Viyangoda